# මිල ගණන් කැඳවීම - 2023

# වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය.

## තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය.

### 01. තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට ඇතුළු වන රථ වාහන සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම.

**විශේෂ කොන්දේසි**

- අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවන අතර පදිංචිය සනාථ කිරීම සඳහා අදාළ ග්‍රාම නිලධාරි විසින් ඉදිරිපත් කරනු ලබන පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- ඇතුළුවන රථ වාහන වලින් පිළිවෙලින් ත්‍රීවීල් සහ අත් ට්‍රැක්ටර් සඳහා රු. 30.00 ක් හා අනෙකුත් සියළුම වාහන වලින් රු.50.00 ක මුදලක් පමණක් අය කළ හැක. ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලය මඟින් අනුමත විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කඩ කාමර බදු හිමියන්ගේ රථ වාහනවලින් අය කිරීම සිදු කළ නොහැක.

- වාහන ඇතුළු කිරීම සඳහා ගේට්ටු 2 ක්, පිටවීම් ගේට්ටු 02ක් හා අමතර ගේට්ටුවක් පවතින අතර, මධ්‍යස්ථානය තුළ වාහන නැවතීමට ඇති ඉඩකඩ ප්‍රමාණය හා උත්සව සමයේ දී සිදුවන අපහසුතා පිළිබඳ සලකා බලා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. (පසුව කරනු ලබන පැමිණිලි හෝ ඉල්ලීම් පිළිබඳ ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරයේ වගකීමක් නැත.)

- ඉදිරිපත් කළ හැකි අවම මාසික ලංසුව රු. 300,000.00 ක් වේ.

- මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ටෙන්ඩර් පෝරම ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයෙන් ලබා ගත හැකි අතර, ඒ සඳහා රු.10,000.00ක ආපසු නොගෙවන මුදලක් හා රු. 100,000.00 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් ගෙවා අදාළ කුවිතාන්සිය ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

- සෑම අය කිරීමක් වෙනුවෙන්ම රිසිට්පතක් නිකුත් කළ යුතු වන අතර තෝරා ගනු ලබන සැපයුම්කරු විසින් වාහන ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කර ගැනීම සිදු කළ යුතුය.

### 02. තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ ආපනශාලාව (01) පවත්වාගෙන යාම

**විශේෂ කොන්දේසි**

- අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි **අයදුම්කරුවන්ගෙන් හා ආයතන වලින්** පමණක් අයදුම්පත් කැඳවන අතර පදිංචිය සනාථ කිරීම සඳහා අදාළ ග්‍රාම නිලධාරි විසින් ඉදිරිපත් කරනු ලබන පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ඇති ඔබ සතු නිපුණතාව ඉදිරිපත් කළ යුතු අතර, ක්ෂේත්‍රය සම්බන්ධව ඇති නිපුණතාව ලංසු ඇගයීමේදී සලකා බලනු ලැබේ.

- ආර්ථික මධ්‍යස්ථාන ආපනශාලා පරිශ්‍රය හා ව්‍යාපාර තත්වයන් හා ස්වභාවයන් ද නිරීක්ෂණය කිරීමෙන් පසු මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව පසුව කරනු ලබන පැමිණිලි හෝ ඉල්ලීම් සම්බන්ධයෙන් ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.

- විදුලි බිල්පත් හා ජල බිල්පත් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. විදුලි බල්බ් හා ජල නළ උපාංග, අනෙකුත් හානියට පත්වන උපාංග සපයා සවි කර ගැනීම ටෙන්ඩර්කරු විසින් සිදු කළ යුතුය.

- සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශයන් සහ රජයේ පාලන මිල සම්බන්ධයෙන් පවත්නා විධි විධාන ප්‍රකාරව ද, පාරිභෝගික ආරක්ෂක පනත යටතේ දැක්වෙන විධි විධානයන්ට අනුව හා කළමනාකරණ භාරය මගින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ආපනශාලාව පවත්වාගෙන යන බවට පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය.

- ඉදිරිපත් කළ හැකි අවම මාසික ලංසුව රු. 20,000.00 ක් වේ.

- මිල ගණන් ඉදිරිපත් කිරිම සඳහා ටෙන්ඩර් පෝරම ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයෙන් ලබා ගැනීම සඳහා රු.5,000.00ක ආපසු නොගෙවන මුදලක් හා රු. 50,000.00 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් ගෙවා අදාළ කුවිතාන්සිය ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

- ආහාර වර්ග සඳහා ටෙන්ඩරයෙහි ඉදිරිපත් කරනු ලබන මිල ගණන් යටතේම අදාළ ආහාර වර්ග ලබා දීම සිදු කළ යුතු අතර, ඒ බව පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

### **03. <u>තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ ආපනශාලාව (03) පවත්වාගෙන යාම</u>**

**විශේෂ කොන්දේසි**

- අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි **අයදුම්කරුවන්ගෙන් හා ආයතන වලින්** පමණක් අයදුම්පත් කැඳවන අතර පදිංචිය සනාථ කිරිම සඳහා අදාළ ග්‍රාම නිලධාරි විසින් ඉදිරිපත් කරනු ලබන පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ඇති ඔබ සතු නිපුණතාව ඉදිරිපත් කළ යුතු අතර, ක්ෂේත්‍රය සම්බන්ධව ඇති නිපුණතාව ලංසු ඇගයීමේදී සලකා බලනු ලැබේ.

- ආර්ථික මධ්‍යස්ථාන ආපනශාලා පරිශ්‍රය හා ව්‍යාපාර තත්වයන් හා ස්වභාවයන් නිරීක්ෂණය කිරීමෙන් පසු මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව පසුව කරනු ලබන පැමිණිලි හෝ ඉල්ලීම් සම්බන්ධයෙන් ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.

- විදුලි බිල්පත් හා ජල බිල්පත් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. විදුලි බල්බ් හා ජල නළ උපාංග, අනෙකුත් හානියට පත්වන උපාංග සපයා සවි කර ගැනීම ටෙන්ඩර්කරු විසින් සිදු කළ යුතුය.

- සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශයන් සහ රජයේ පාලන මිල සම්බන්ධයෙන් පවත්නා විධි විධාන ප්‍රකාරව ද, පාරිභෝගික ආරක්ෂක පනත යටතේ දැක්වෙන විධි විධානයන්ට අනුව හා කළමනාකරණ භාරය මගින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ආපනශාලාව පවත්වාගෙන යන බවට පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය.

- ඉදිරිපත් කළ හැකි අවම මාසික ලංසුව රු. 10,000.00 ක් වේ.

- මිල ගණන් ඉදිරිපත් කිරිම සඳහා ටෙන්ඩර් පෝරම ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයෙන් ලබා ගැනීම සඳහා රු.5,000.00ක ආපසු නොගෙවන මුදලක් හා රු. 50,000.00 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් ගෙවා අදාළ කුවිතාන්සිය ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

- ආහාර වර්ග සඳහා ටෙන්ඩරයෙහි ඉදිරිපත් කරනු ලබන මිල ගණන් යටතේම අදාළ ආහාර වර්ග ලබා දීම සිදු කළ යුතු අතර, ඒ බව පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

# පොදු කොන්දේසි

- වෙසක් සහ පොසොන් පෝය නිමිත්තෙන් දින 02 බැගින් හා අනෙක් සෑම මසකම පසලොස්වක පෝය දිනයන්හි ආර්ථික මධ්‍යස්ථානය වසා තබන අතර, සිංහල දෙමළ අලුත් අවුරුදු කාලය සඳහා දින 04කට නොඅඩු දින 06කට නොවැඩි කාලයක් මධ්‍යස්ථානය වසා තබනු ලැබේ. ඒ පිළිබඳව සලකා බලා මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, පසුව කරනු ලබන පැමිණිලි හෝ ඉල්ලීම් පිළිබඳ භාරයේ වගකීමක් නැත.

- ගිවිසුම් කාලය 2023/01/01 – 2023/12/31 දක්වා වේ.

- සියළුම සේවාවන් හා පරිශ්‍රයේ තත්වයන්, ස්වභාවයන් පරීක්ෂා කර බලා මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, කළමනාකරණ භාරය සමඟ කොන්ත්‍රාත්කරු නීත්‍යානුකූල ගිවිසුමකට එළඹිය යුතු ය. තව ද ගිවිසුමට එළඹීමට පෙර කළමනාකරණ භාරය මඟින් තීරණය කරනු ලබන ඇප මුදලක් හෝ ඇප මුදලට සමාන බැංකු සහතිකයක් කළමනාකරණ භාරයේ හෝ භාරය මඟින් නියම කරනු ලබන බැංකු ගිණුමක තැන්පත් කළ යුතු අතර කොන්ත්‍රාත් කාලය තුළ කොන්ත්‍රාත්කරු කළමනාකරණ භාරයට ගෙවිය යුතු හිඟ දඩ හෝ බදු මුදල් නොමැති නම් මෙම මුදල කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු ටෙන්ඩර්කරු වෙත ආපසු ලබා දෙනු ලැබේ.

- තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු ගෙවිය යුතු මාසික බදු මුදල සෑම මසකම 15 වන දිනයට ප්‍රථම ගෙවිය යුතු අතර, ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම ඔබ විසින් ගෙවනු ලබන මාසික බදු මුදලින් 10% ක අමතර දඩ මුදලක් අයකරනු ලැබේ.

- ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත ටෙන්ඩර් පිරිනැමීමෙන් පසු අදාළ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළ නොහැකි අතර, එසේ ප්‍රතික්ෂේප කළහොත් ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල කළමනාකරණ භාරය විසින් රඳවා ගනු ලැබේ. එය පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, ඉකුත් වර්ෂ වලදී ටෙන්ඩර් ප්‍රතික්ෂේප කළ ආයතන හෝ පුද්ගලයින් සඳහා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු නොලැබේ.

- භාරයේ අවශ්‍යතාවය මත ඕනෑම අවස්ථාවක දින 14කට පෙර දැනුම් දීමෙන් පසුව අදාළ සේවාව සැපයීම නැවැත්වීමේ අයිතිය තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය සතු වේ. තෝරාගන්නා බදු කරු කළමනාකරණ භාරය සමඟ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹිය යුතු අතර, ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරනු ලැබුවහොත් වහාම අදාළ ගිවිසුම අවලංගු කිරීමේ බලය කළමනාකරණ භාරය සතු බව පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ.

- ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම 2022/11/18 වන දින සිට 2022/11/30 වන දින දක්වා කාර්යාල දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ කාර්යාලයේ දී සිදු කරනු ලබයි.

- ටෙන්ඩර් පෝරම ලබා ගැනීම සඳහා ගෙවනු ලබන මුදල හා ආපසු ගෙවන ලබන ඇප තැන්පත් මුදල ලංකා බැංකුව, තඹුත්තේගම ශාඛාවේ ඇති " තඹුත්තේගම විශේෂ ආර්ථික මධ්‍යස්ථාන භාර අරමුදල ගිණුම් අංක 72382324" දරණ ගිණුමට බැර කළ යුතුය.

- ඉහත පරිදි මුදල් ගෙවා ලබා ගනු ලබන තැන්පත් කුවිතාන්සිය ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයට ලබා දී මුදල් ගෙවූ බවට ලදුපත් ලබා ගත යුතුය. එසේ ලබා ගන්නා ආපසු ගෙවනු ලබන ඇප මුදල වෙනුවෙන් නිකුත් කරනු ලබන ලදු පත ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛන සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

- ටෙන්ඩර්පත් භාර ගැනීම 2022/12/01 වන දින ප.ව 02.00 ට අවසන් කරනු ලැබේ.

- සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් ප්‍රාදේශීය ලේකම් / ප්‍රසම්පාදන කමිටු සභාපති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තඹුත්තේගම යන ලිපිනයට 2022/12/01 දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. අතින් ගෙනවිත් භාරදෙන්නේනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසුව ඉදිරිපත් කරනු ලබන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සේවාවේ නම පැහැදිලිව සඳහන් කර කවරය සීල් තබා ඉදිරිපත් කළ යුතුය.

- මෙම ප්‍රසම්පාදනයට අදාළව නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ලියකියවිලි සමඟ වන ප්‍රසම්පාදන කොන්දේසි සියල්ලටම යටත්ව හා එකඟව ඔබගේ මිල ගණන් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසුව එකී කොන්දේසි සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.
- ඉල්ලා ඇති ඇමුණුම් රහිත, අසම්පූර්ණ, විකෘති කරන ලද, වෙනස් කරන ලද හෝ මෙම ප්‍රසම්පාදනයට අදාළ කොන්දේසි වලට අනුකූල නොවන ටෙන්ඩරයක් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ බලය තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.
- අදාළ ටෙන්ඩර්පත් විවෘත කිරීම 2022/12/01 දින ප.ව 02.00 ට තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සිදු කරනු ලබන අතර ඉල්ලුම්කරුට හෝ බලයලත් නියෝජිතයකුට ඒ අවස්ථාවට සහභාගි විය හැක. බලයලත් නියෝජිතයෙක් සහභාගී කරවන්නේනම් ඒ සඳහා විධිමත් පරිදි බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මණ්ඩලය හා තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරයේ තීරණය අවසාන තීරණය වේ.

වැඩි විස්තර මධ්‍යස්ථාන කළමනාකරුගෙන් දු.අ. 025- 2275171 මගින් හෝ ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයට පැමිණ ලබා ගත හැක.

**අණ පරිදි,**
**සුමිත් .කේ. සෝමරත්න,**
**ප්‍රාදේශිය ලේකම් (තඹුත්තේගම) / ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය,**
**කළමනාකරණ කාර්යාලය,**
**තඹුත්තේගම.**
2022/11/18